# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/5/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................................ | දිනය<br>திகதி<br>Date | 2021.03.25 |

සමෘද්ධි ප්‍රජාමූල චක්‍රලේඛ 2021/08

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් ,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,
විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත.

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති පරිගණක මෘදුකාංගය වෙනුවෙන් අය කරනු ලබන සේවා ගාස්තු ගෙන්වා ගැනීම.</u>**

වර්තමානයේ පැවති අභියෝග හමුවේ උක්ත කරුණට අදාලව මේ වන විට අත්කරගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් ඔබ සහ ඊට අදාලව කටයුතු කරනු ලබන සියළු නිලධාරීන් වෙත ස්තුතිය පුද කරමි.

02. 2021.04.12 දින වන විට දිස්ත්‍රික්කයේ සියළුම බැංකු හා බැංකු සමිති වල මෘදුකාංගය ස්ථාපිත කර අවසන් කිරීමට කළමනාකරණ මණ්ඩලය උපදෙස් ලබාදී ඇත.

03. තවද, මේ වන විට දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් මෘදුකාංගය සැකසීම හා තාක්ෂණ සහාය ලබාගැනීම වෙනුවෙන් මෘදුකාංග සපයන ආයතන වෙත කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත මාසිකව සේවා සැපයීම වෙනුවෙන් ගෙවීම් සිදු කර ඇත. එය සමස්ථ බැංකු පද්ධතිය වෙනුවෙන් වුවද, මෙම කාර්ය සම්බන්ධයෙන් ඇතැම් බැංකු හා බැංකු සමිතිවල නිලධාරීන්ගේ උනන්දුව හා කැපවීම ප්‍රමාණවත් නොවන බව පෙනී යයි.

04. මෘදුකාංගය ස්ථාපිත කර අවසන් කිරීමෙන් පසුව අදාල සේවා සපයන ආයතන වෙත මෘදුකාංගය පවත්වාගෙන යාමේ සේවා ගාස්තු සහ Server පහසුකම් සඳහා අත්සන් කරන ලද ගිවිසුම අනුව, මාසික සේවා ගාස්තුවක් ගෙවිය යුතු අතර, ඒ අනුව, සෑම බැංකුවකින්ම එම වියදම දරා ගැනීම සිදුකළ යුතුය.

05. එම ගිවිසුම අත්සන් කරන තෙක් එම සේවා සපයන ආයතවලට ගෙවීම් කිරීම සඳහා සියළුම බැංකු හා බැංකු සමිතිවලින් 2021 මාර්තු මස සිට ඉදිරියට මාසික සේවා ගාස්තු වන රු. 7000/= ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලබා ගැනීමට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එම සේවා ගාස්තු ලබාදීමේ දී පහත පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

5.1 සෑම සමෘද්ධි බැංකුවක් විසින් මාසික සේවා ගාස්තුවට අදාල චෙක්පත බැංකු සමිති ජංගම ගිණුමට බැර වන සේ චෙක්පතකින් ලබාදිය යුතුය. ඒ සඳහා ගිණුම් සටහන පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වැය ගිණුම පරිගණක නඩත්තු, උපාංග මිලදී ගැනීම් හා සේවා ගාස්තු ගිණුම | - | හර (කේත අංක 2140) |
| ජංගම ගිණුම | - | බැර |


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

5.2 සමෘද්ධි බැංකු සමිතිය විසින් පොදු ලෙජරයේ පරිගණක **මෘදුකාංග සඳහා වූ සේවා ගාස්තු රැස් කිරීමේ ගිණුම** (කේත අංක 9315) නමින් ගිණුමක් විවෘත කර, සමෘද්ධි බැංකුව ලබාදුන් චෙක්පත උපලබ්ධි වූ පසු පහත ගිණුම් සටහන තැබිය යුතුය.

| | | |
|---|---|---|
| ජංගම ගිණුම | - | හර |
| පරිගණක මෘදුකාංගය සඳහා වූ සේවා ගාස්තු රැස්කිරීමේ ගිණුම | - | බැර (කේත අංක 9315) |

5.3 **ඉන් අනතුරුව සමෘද්ධි බැංකු සමිතිය විසින් තම බැංකු සමිතියට අයත් සියළුම බැංකු වල රැස් කරන සේවා ගාස්තු මුදල් සහ බැංකු සමිතියට අදාල මාසික සේවා ගාස්තුව සමග චෙක්පතක් "කළමනාකරු, ලංකා බැංකු, බත්තරමුල්ල ප්‍රජාමූල බැංකු අංශය - ආයෝජන ගිණුම ජ.ගි 3417925 ට " බැර වන සේ ලියා පහත ගිණුම් සටහන තැබිය යුතුය.**

| | | |
|---|---|---|
| වැය ගිණුම - පරිගණක නඩත්තු, උපාංග මිලදී ගැනීම් හා සේවා ගාස්තු ගිණුම | - | හර (කේත අංක 6307) |
| පරිගණක මෘදුකාංගය සඳහා වූ සේවා ගාස්තු රැස්කිරීමේ ගිණුම | - | හර (කේත අංක 9315) |
| ජංගම ගිණුම | - | බැර |

5.4 සෑම මසක්ම අවසන් වී ඊළග මාසයේ 05 දිනට පෙර චෙක්පත ලියාපදිංචි තැපෑලෙන් ප්‍රජාමූල බැංකු අංශයට එවිය යුතු අතර, චෙක්පත් ලබාදුන් බැංකුවල නම් ඇතුලත් ලේඛනයක් සමග ආවරණ ලිපියක්ද එවිය යුතුය.

5.5 සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විසින් සේවා ගාස්තු රැස් කිරීම, රැස් කරන ලද සේවා ගාස්තු **ප්‍රජාමූල** බැංකු අංශයට එවීම සම්බන්ධව වෙන වෙනම රෙජිස්තර නඩත්තු කිරීම ද කල යුතුය.

06. ඒ ඒ බැංකු මෘදුකාංගය ස්ථාපිත කර අවසන් කිරීමෙන් පසුව, විගණන අංශයෙන් ලබාදෙන සහතිකය වෙනුවෙන් ආයතන සමග ඇතිකරගනු ලබන ගිවිසුම අනුව ගෙවීම් කිරීමට උපදෙස් නිකුත් කෙරේ.

07. සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වලින් ප්‍රජාවට සපයන සේවාවන් කාර්යක්ෂමව ඉටුකිරීමට අවශ්‍ය අනෙකුත් පසහුකම් ලබාදීම ඉදිරියේ දී සිදුවන අතර මේ වන විට ඔබ සෑම දැක්වූ සහය අගය කරමි.

ආර්.පී බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල් .

පිටපත් :- 01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.පි.
02. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.පි.
03. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස
04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස
05. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස
06. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස